# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,220 - 2021 මාර්තු මස 19 වැනි සිකුරාදා - 2021.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 470 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- (i) මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 05 වැනි දින වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත 2021 මාර්තු මස 05 වැනි දින වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අප්‍රේල් මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මාර්තු මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## සංශෝධනයයි

## සීතාවක ප්‍රාදේශීය සභාව

2017.12.22 වැනි දින පළ වූ අංක 2,051 *ගැසට් පත්‍රයේ* 12-604 නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුය. :-

**සීතාවක ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 02 වන වගන්තිය යටතේ
කරනු ලබන නිවේදනයයි

සීතාවක ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්ය, කර්තව්‍ය ඉටුකරන සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ. ඒ. චන්දන පද්මසිරි වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2018.01.01 වැනි දින සිට සීතාවක ප්‍රාදේශීය සභාව සතු මාර්ග පරිහරණය කිරීමේ දී බර හා වේග සීමාව පහත ආකාරයට විය යුතු බවට 2017.11.30 වැනි දින අංක 9740 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

කේ. ඒ. චන්දන පද්මසිරි,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල.

2017 නොවැම්බර් මස 30 වැනි දින,
සීතවක ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**තීරණය**

2017 ජනවාරි මස 01 වැනි දින සීතාවක ප්‍රාදේශීය සභාව විසින් වැළඳගත් 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව ඔහු විසින් සම්පාදනය කළ අංක 1947/6 දරන 2015 දෙසැම්බර් මස 28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ කර අංක 1976/21 දරන 2016 ජූලි මස 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කර පිළිගත්තා වූ සම්මත අතුරු ව්‍යවස්ථාවල සහා බල ප්‍රදේශයන්හි මාර්ගවල වාහන පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රාදේශීය සභාවට අයත් පහත උපලේඛනයේ සඳහන් මාර්ග පරිහරණය කිරීමේ දී එකී මාර්ගවල ධාවනය කරන වාහනයක උපරිම බර හා වේගය ටොන් 05 හා පැයට කි. මී. 30 විය යුතු බවට මම තීරණය කරමි.

***ඉහත කී උපලේඛනය***

| *අනු. අංකය* | *පාරේ නම* | *ආරම්භක ස්ථානය* | *අවසාන ස්ථානය* | *දිග (Km)* | *පළල (m)* |
|---|---|---|---|---|---|
| 01 | පහළ හංවැල්ල තුන්නාන පාර | පරණ පාර | පන්සල පාර (අළුත් පාර) | 3.70 | 5.4 |
| 02 | තුන්නාන ගම්මැද්ද පාර | පහළ හංවැල්ල තුන්නාන පාර | රිටිගහහේන පාර | 1.40 | 4.3 |
| 03 | තුන්නාන බරාව පාර | ගම්මැද්ද පාර | බරාව | 0.80 | 4.2 |
| 04 | තුන්නාන එගොඩකැලේ පාර | ජයවීරගොඩ පාර | බරාව | 1.00 | 6.0 |
| 05 | තුන්නාන කුඩළුවිල පාර | හයිලෙවල් පාර | ජයවීරගොඩ පාර | 1.00 | 5.5 |
| 06 | කුඩළුවිල ඊරියගොල්ල පාර | කුඩළුවිල ඊරියගොල්ල පාර | ඊරියගොල්ල පාර | 0.70 | 4.0 |

03-386

## ජා-ඇල නගර සභාව

2021 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 166 වගන්තිය සමග කියවිය යුතු මහ නගර සභා ආඥා පනතේ 238(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ජා-ඇල නගර සභාවට පැවරී ඇති බලතල අනුව 2021 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පිණිස ජා-ඇල නගර සභා බල ප්‍රදේශය ඇතුලත පිහිටි සියලුම වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම මත 2016 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව 2021 වර්ෂය සඳහා පිළිගෙන පැනවීමට 2020 ඔක්තෝබර් මස 27 වැනි දින පැවති මහ සභාවේ අංක (05)-01-13. (05)-01-14 සහ (05)-01-15 යටතේ සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 166 වන වගන්තිය යටතේ ජා-ඇල නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2016 වර්ෂය සඳහා වූ තක්සේරුව 2021 වර්ෂය සඳහා වූ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවත්, 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 160(1) සහ 160(1අ) වගන්ති මගින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී තක්සේරුව මත එම දේපල සඳහා ඉහත කී වාර්ෂික වටිනාකමින් නේවාසික දේපල වෙනුවෙන් සියයට තුන (3%) ක් ද, වානිජ දේපළ සඳහා සියයට දහය (10%) ක් ද වාර්ෂික වරිපනම් බද්ද ලෙස නියම විය යුතු බවත්,

2021 වර්ෂය තුල පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් එහි ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස සම්පූර්ණ වාර්ෂික වරිපනම් බද්ද(හිඟ ශේෂයක් නොමැති විටදී) 2021 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක 10% වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එක් කාර්තුවකට අදළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද නගර සභාව විසින් ලබා දිය යුතු බවටත්, 2021 වර්ෂයට අදාළ වරිපනම් බදු පහත උපලේඛනයෙහි II තීරුවෙහි පරිදි නියමිත කාර්තුව අවසාන දින හෝ ඊට පෙර ගෙවා අවසන් නොකළහොත්, එදිනට පසු එළඹෙන දින සිට නේවාසික දේපළ සඳහා 15%ක අධිගාස්තුවක් ද, නේවාසික නොවන දේපල සඳහා 20% ක අධි ගාස්තුවක් ද, වරිපනම් බද්දට එකතු කළ යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

| *I තීරුව*<br>*කාර්තුව* | *II තීරුව*<br>*ගෙවිය යුතු දිනය* | *III තීරුව*<br>*5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු කාර්තුව | 2021.03.31 | 2021.01.31 |
| දෙවන කාර්තුව | 2021.06.30 | 2021.04.30 |
| තුන්වන කාර්තුව | 2021.09.30 | 2021.07.31 |
| හතරවන කාර්තුව | 2021.12.31 | 2021.10.31 |

එම්. ශම්මික ඩයස්,
සභාපති,
නගර සභාව, ජා-ඇල.

2020 ඔක්තෝබර් මස 29 වැනි දින.
ජා-ඇල නගර සභා කාර්යාලයේ දී ය.

03-581

## ආණමඩුව ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරාත්මකව දක්වා ඇති ස්ථානයන්හි ගෝඝාතකාගාර පවත්වාගෙන යාම සඳහා 2021 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත දන්වා එවිය යුතු බව, ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. එච්. එම්. ප්‍රියන්ත බණ්ඩාර රාජකරුණා,  
සභාපති,  
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2021 වර්ෂයේ පෙබරවාරි මස 19 වැනි දින,  
ආණමඩුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය 01**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ගෝ ඝාතකාගාරය පවත්වාගෙන යන ස්ථානය* | *බලපත්‍රය වලංගු කාල සීමාව* |
|---|---|---|---|
| 1 | එම්. ඒ. එම්. නස්ලීම් | කම්මන්දළුව, ආඬිගම | 2021.12.31 දක්වා |
| 2 | එස්. එච්. එම්. රියාස් | මදවක්කුලම, ආඬිගම | 2021.12.31 දක්වා |
| 3 | ඩබ්. කසුන් මධුශංක | බරුවලබැද්ද, බරණන්කට්ටුව, මුන්දලම | 2021.12.31 දක්වා |

03-718

---

## අකුරණ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හා අකුරණ ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන මංමාවත්, පාරවල් සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ පියවර අනුගමනය කිරීම සම්බන්ධයෙන් අවසර ඇති කාලයක් වශයෙන් 2019.06.01 සිට 2022.06.01 දක්වා වූ කාලය සැලකීමට 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 : 1 උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා අවසර දී ඇති බැවින් ද,


ඒ අනුව, මෙහි පහත සඳහන් ඡේදයේ විස්තර කරන මංමාවත්, පාර ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාර, මංමාවත් ලෙස සැලකීමට අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021.02.09 දින අංක ඉ.7 දරන යෝජනා සම්මුතිය යටතේ යෝජනා සම්මත කර ඇති හෙයින්, ඊට විරෝධතා ඇත්නම්, ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීම සඳහා මෙයින් නිවේදනය කරමි.

අයි. එම්. ඉස්තිහාර්,  
සභාපති,  
අකුරණ ප්‍රාදේශීය සභාව,  
අලවතුගොඩ.

2021 පෙබරවාරි මස  
අකුරණ ප්‍රාදේශීය සභාව,  
අලවතුගොඩ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග* | *පළල* | *මායිම්* |
|---|---|---|---|---|
| 01 | පහුරේ වත්ත මාර්ගය<br><br>මුල්වලව්වත්ත මාර්ගයේ සිට එම්. ජී. ජී. පී. බී. කරුණාතිලක මයාගේ ඉඩම මාධ්‍යයෙන් ඩී. යූ. ජී. කරුණාදාස මයාගේ ඉඩම තෙක් දිවෙන මාර්ගය | මීටර් 143.1 | මීටර් 3.0 සිට 4.7 | ඩබ්. ඩබ්. සී. කේ. මැන්දිස්, බලයලත් මිනින්දෝරු විසින් මැන සකස් කරන ලද, 2020.12.24 දිනැති අංක දරන පිඹුරේ සඳහන් පරිදි,<br><br>*වම්පස :*<br><br>මුල්වලව්ව් වත්ත දූනුවිල අංක 209/2 හි පදිංචි එම්. ජී. ජී. පී. බී. කරුණාතිලක හිමිකම් කියන ඉඩම පහුරේ වත්ත දූනුවිල, අංක 209/2/1 හි පදිංචි සුවනිතා සුනාලි රාජපක්ෂ හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල, අංක 202/1 හි පදිංචි එම්. ජී. ජයසරණ හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල අංක 209 හි පදිංචි ඩී. යූ. ජී. කරුණාදස හිමිකම් කියන ඉඩම.<br><br>*දකුණුපස :*<br><br>මුල්වලව්ව වත්ත දූනුවිල අංක 209/2 හි පදිංචි එම්. ජී. ජී. පී. බී. කරුණාතිලක හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල අංක 202/1 හි පදිංචි එම්. ජී. ජයසරණ හිමිකම් කියන ඉඩම, පහුරේ වත්ත දූනුවිල, ගල්කැටියාව පාරේ පදිංචි උපාලි ගුණවර්ධන හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල අංක 209 හි පදිංචි ඩී. යූ. ජී. කරුණාදස හිමිකම් කියන ඉඩම.<br><br>*නැවතත්*<br><br>වම්පස :<br><br>මුල්වලව්ව වත්ත දූනුවිල, අංක 208 හි පදිංචි එම්. ගාමිණී හිමිකම් කියන ඉඩම, මුල්වලව්ව වත්ත දූනුවිල අංක 209/2 හි පදිංචි එම්. ජී. ජී. පී. බී. කරුණාතිලක හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල අංක 209/1 හි පදිංචි එච්. ජී. විලියම් හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල අංක 202/1 හි පදිංචි එම්. ජී. ජයසරණ හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල අංක 209 හි පදිංචි ඩී. යූ. ජී. කරුණාදාස හිමිකම් කියන ඉඩම.<br><br>*දකුණුපස :*<br><br>පහුරේවත්ත දූනුවිල, අංක 209/1 හි පදිංචි එච්. ජී. විලියම් හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල, ගල්කැටියාව පාරේ පදිංචි උපාලි ගුණවර්ධන හිමිකම් කියන ඉඩම, පහුරේවත්ත දූනුවිල අංක 209 හි පදිංචි ඩී. යූ. ජී. කරුණාදාස හිමිකම් කියන ඉඩම. |




03-493

## අකුරණ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හා අකුරණ ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන මංමාවත්, පාරවල් සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ වූ පියවර අනුගමනය කිරීම සම්බන්ධයෙන් අවසර ඇති කාලයක් වශයෙන් 2019.06.01 සිට 2022.06.01 දක්වා වූ කාලය සැලකීමට 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු, ඉහත කී, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 1 උපවගන්තිය යටතේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා අවසර දී ඇති බැවින්ද,


ඒ අනුව, මෙහි පහත සඳහන් ඡේදයේ විස්තර කරන මංමාවත්, පාර ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාර, මංමාවත් ලෙස සැලකීමට අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2021.02.09 දින අංක ඉ.5 දරන යෝජනා සම්මුතිය යටතේ යෝජනා සම්මත කර ඇති හෙයින්, ඊට විරෝධතා ඇත්නම්, ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව කටයුතු කිරීම සඳහා මෙයින් නිවේදනය කරමි.

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2021 පෙබරවාරි මස
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

### උපලේඛනය

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග* | *පළල* | *මායිම්* |
|---|---|---|---|---|
| 01 | බුලුගොහොතැන්න අරෆා පල්ලිය ඉදිරිපිට හරස් මාර්ගය<br><br>කසාවත්ත සිට අකුරණ දක්වා යන මාර්ගයේ<br><br>ජී. ජී. ඒ. ආර්. සෙයියඩ් මොහොමඩ් මායා ගේ නිවස අසලින් පටන්ගෙන එන්. එම්. ජසීම් උම්මා මියගේ නිවස අසලින් අවසන් වන හරස් මාර්ගය | අඩි 262 | අඩි 08 | ප්‍රියන්ත පුංචිහේවා බලයලත් මිනින්දෝරු විසින් මැන සකස් කරන ලද 2020.06.02 දිනැති 13604 දරන පිඹුරේ සඳහන් පරිදි,<br><br>වම්පස :<br><br>ජී. ජී. ඒ. ආර්. සෙයියඩ් මොහොමඩ් (ඔප්පු අංක 1968), ඒ.සී. එම්. ෆරීස් මොහොමඩ් (ඔප්පු අංක 1968), ඒ. එම්. එච්. මොහොමඩ් (ඔප්පු අංක 1968) රාසික් (ඔප්පු අංක 1968) එන්. එම්. ජසිම් උම්මා (ඔප්පු අංක 1968)<br><br>දකුණු පස :<br><br>පුද්ගලික මාර්ගය, එස්. එච්. එම්. සාජහාන් (ඔප්පු අංක 1968) යන ඉඩම්වලට මායිම් වේ. |




SCALE 1: 500

**PLAN**
OF

*An allotment divided portion of the land called*
*Hingure watta alias Hingure hena*

*(ARAFA LANE)*

**SITUATED AT**

*Bulugohotenna,Akurana in Pallegampaha Korale of Harispattu*

*(Bulugohotenna G.N.Division No 559 of Akurana Secretarial Division & Pradesiya Sabha)*

**KANDY DISTRICT**

**CENTRAL PROVINCE**

**Containing in Extent :**

| Lot No | Hectare | $m^2$ | A | R | P | Allotted to |
|---|---|---|---|---|---|---|
| 1 | 0.03111 | 311 | 0 | 0 | 12.30 | Min.10ft.wide Road Reserved for Akurana(PS) |

Note: surveyed request of the Akurana PS,
Letter No CPC/APS/A/07/8/71 dated 2020-03-12
boundaris pointed out by clients

PRIYANTHA PUNCHIHEWA
Licensed Surveyor & Leveller,
PUJAPITIYA.

Surveyed on :02-06-2020
F.B.:281/15-16

Licensed Surveyor & Leveller.

03-484

## මාවතගම ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) හා 24(2) වැනි වගන්ති යටතේ කරනු ලබන නිවේදනයයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති මංමාවත මාවතගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ සිට මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දනුම් දෙමි.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට අඩි 25 බල පැවැත්වේ.

එස්. කේ. අනුර කමල් පෙරේරා,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව,<br>
මාවතගම.

2021 මාර්තු මස 05 වැනි දින,<br>
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලය.

| | | |
|---|---|---|
| කොට්ඨාසය | - | වැළඩ |
| ග්‍රාම නිලධාරී වසම | - | 646 වාඩියගොඩ |
| මාර්ගයේ නම | - | කහකොටුව වත්ත ඇතුමලේ මාර්ගය |
| ආරම්භය | - | කවසිගමුවේ සිට නුවර පාරේ කහකොටුව හන්දියේ සිට |
| අවසානය | - | ආර්. එම්. සමරකෝන් මහතාගේ ඉඩම අසලින් |
| පාරේ දිග | - | මීටර් 168 |
| පාරේ පළල | - | අඩි 9 |

*පාරේ වම්පස හිමියන්*


01. ඩබ්. ඒ. ඩී. විජේසිංහ මයා
02. බී. බී. ප්‍රේමදන්ද්‍ර මයා
03. ඒ. එම්. අතපත්තු මයා
04. එස්. එම්. සමරකෝන් මයා
05. ඩබ්. එම්. ප්‍රසන්න මංජුල මයා
06. එස්. එම්. පී. එම්. සමරකෝන් මිය

*පාරේ දකුණුපස හිමියන්*

01. ඩබ්. ඒ. ඩී. විජේසිංහ මයා
02. ඒ. එම්. සෙනෙවිරත්න මයා
03. එච්. එම්. ආර්. හේරත් මයා
04. එච්. එම්. එස්. හේරත් මයා
05. ඩබ්. ඩී. සිරිදරා

ඩබ්ලිව්. ඇම්. තිලකරත්න බණ්ඩා
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු,
බාලසූරිය වත්ත, මාවතගම
දුරකථන අංකය -037-2299021

සැලැස්මේ අංකය - 4888



සටහන

මායිම් පෙන්වීම ඉඩම් හිමියන් සහ විස්තර පොදුජන ලද්දේ පාර ලඟුන් අනුදැනුමෙනි.

මෙම මාර්ගය පළල අඩි 9 ක් වුවත් සමහරස්ථානවල පළල අඩි 9 ට වඩා වෙනස්වී ඇත.

පරිමාණය - 1:1000

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැදෑව විල්ලව හත්පත්තුවේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාවතගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැදෑව කෝරලේ අංක 646 වාඩියගොඩ ග්‍රාම නිලධාරී වසමේ ගනේගොඩ පිහිටි කහකොටුවවත්ත අත්තමලේ පාර (කහකොටුව හන්දිය සිට දේවාල හන්දිය දක්වා) අඩි 9 ක් පළල මාර්ගයක් සඳහා මැන සාදන ලද (දිග මීටර් 168, අඩි 546 ක් පමණ) සාදන ලද සැලැස්ම

ඩබ්ලිව්. ඇම්. තිලකරත්න බණ්ඩා
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
බාලසූරිය වත්ත
මාවතගම
ලියාපදිංචි අංකය

මනින ලද දිනය - 2020 - 10 - 30

සංශෝධනයයි

## බලපිටිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

2021.02.19 දිනැති *ගැසට් පත්‍රයේ* අංක 02/304/2 යටතේ පළ වූ ඉහත නිවේදනයේ අනු අංක 84 හා 86 පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි:

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *දිග (කි. මී.)* | *පළල (මීටර්)* | *ආරම්භය* | *අවසානය* |
|---|---|---|---|---|---|
| 84 | දිය කෙළිලු වත්ත ඉඩමට අදාළ මාර්ග | 24 බී කටුවිල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දියකෙළිලු වත්ත ඉඩමට අදාළව බලයලත් මානක එල්. ආර්. එස්. ද සිල්වා මහතාගේ 2017.03.11 දිනැති අංක 1096 පිඹුරේ කැබලි අංක 13 | | | |
| 86 | උස්වත්ත පාර | 0.292 | 3.0 | ධම්මකුසල මාවත | ගාලු පාර |

එන්. සමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය ප්‍රාදේශීය සභාව

2021 මාර්තු මස 03 වැනි දින,
බලපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

03-361

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.